**ශීර්ෂය 122 සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 122 - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2022දෙසැම්බර් 31 දිනට සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කර එය පදනම් කරගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වියදම් දැරීම නොකළ අවස්ථා නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා වෙන්කළ රු.653,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය රු.71,262,395 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 11ක් ද, ප්‍රාග්ධන වියදම සඳහා වෙන්කළ රු.2,732,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය රු.740,691,144ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 27 ක් වී තිබුණි. | ඇස්තමේන්තු එදිනට පවතින තත්වයන් මත පුරෝකථනය කර ප්‍රතිපාදන ඉල්ලුම් කර අනුමත ප්‍රතිපාදන අනුව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. 2022 වර්ෂයේ ඉන්ධන හිඟය, ප්‍රවාහන අපහසුතා,කාර්යාල විවෘත කරන දින ගණන අඩු කිරීම, නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරීම, විශේෂ නිවාඩු දින ප්‍රකාශයට පත් කිරීම ආදී හේතු මත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. රජය විසින් නිකුත් කරන ලද රාජ්‍ය අයවැය චක්‍රලේඛ 3/2021, 3/2022, 4/2022 ඇතුළු වියදම් කළමනාකරණ චක්‍රලේඛ මගින් විදේශ ගමන් අත්හිටුවීම, ප්‍රාග්ධන මිලදී ගැනීම් හා ප්‍රාග්ධන වියදම් සීමාකිරීම හා ප්‍රමුඛතා පදනමින් අනෙකුත් වියදම් දැරීමත්, 2022 වර්ෂයේ මැද භාගයේදී සංචාරක අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය හා ඒකාබද්ධ කිරීම තුළ එක් අමාත්‍යවරයකුගේ ප්‍රතිපාදන ඉතිරිවීම සිදුවිය. ඒ අනුව පුනරාවර්තන වියදම් සඳහා වෙන්කල ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස සියයට11ක්ද, මූලධන වියදම් සඳහා වෙන්කල ප්‍රතිපාදනයන්ගෙන්සියයට 27ක්ද ඉතිරිවීම් සිදු වී තිබුණි. | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් සකස් කළ යුතුය . |
| (ආ) | වැය විෂයන් 11 කට අදාළව සලසා තිබුණු එකතුව රු.316,725,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | විදේශ ගමන් අත්හිටුවීම හා අමාත්‍යවරුන් කුලී නිවාස ඉල්ලුම් නොකිරීම මත ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී ඇත.එසේම අයවැය චක්‍රලේඛ 3/2022 අනුව, වියදම් කළමනාකරණය හා රටෙහි පැවති අයහපත් ආර්ථික තත්වය මත වියදම් සීමා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. අමාත්‍යවරයාගේ වැය විෂයන්වල ප්‍රතිපාදනද සම්පූර්ණයෙන්ම ඉතිරි වී ඇත. කොන්ත්‍රාත් සමාගම විසින් මිල ඉහල යාම් ඉල්ලුම්කළද, | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඊට අනුමැතිය නොලැබීම හා ප්‍රතිපාදන වෙන්කර තිබුණද මහා භාණ්ඩාගාරය විසින් අක්මුදල් ලබා දීමට එකඟ නොවීම මත වැය විෂයයේ ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | |
| (ඇ) | වැය විෂයන් 09 කට අදාළව සලසා තිබුණු එකතුව රු.60,615,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.52,552,198 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 75 ක් ඉක්මවා තිබුණි. | ඇස්තමේන්තු ප්‍රතිපාදන වලින්සියයට 75කට වැඩි ඉතිරිවීමට සංචාරක අමාත්‍යතුමාට වෙන්කරන ලද වියදම් ඉඩම් අංශය මඟින් දැරීම, රටතුළ පැවති අයහපත් ආර්ථික තත්වය නිසා වියදම් සීමා කිරීමහා අයවැය චක්‍රලේඛ වලට අනුව වියදම් කළමනාකරණය කිරීම හේතුවෙන් වැය විෂයන්හි ඉතිරිවීම් සිදු වී ඇත. අමාත්‍ය නිල නිවාස සඳහා ජල හෝ විදුලි බිල්පත් ගෙවීමට ඉදිරිපත් නොවීම හා අමාත්‍ය කාර්යාලයේ සුළු අලුත්වැඩියා අවශ්‍යතාවයන් වර්ෂය තුළ මතු නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් සකස් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහය තුළ, භෞතික වත්කම් ඉදි කිරීම,මිළදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වටිනාකම වූ රු. 41,384,298 ක් තුළ යන්ත්‍ර සූත්‍ර හා වාහන අලුත්වැඩියාව වෙනුවෙන් දරන ලද රු,7,282,743 ක පුනරාවර්තන ස්වරූපයේ වියදම් ඇතුළත් කර තිබීමෙන් අදාළ වැය ශීර්ෂ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මූලධන වියදම් වැඩසටහන 1 සහ වැඩසටහන 2 යටතේ මුලු වියදම රු. 41,384,298 කි.ඒ අනුව, මූලධන වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම් යටතේ දක්වා ඇති අතර අදාළ වැය විෂයන්හි වියදම් වැඩියෙන් දැක්වීමක් සිදු කර නොමැත. මූල්‍ය ප්‍රකාශන ආකෘති ACA 2(ii) අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමට අදාළ වැය විෂයන් වන 2001,2002 හා 2003ද රාජ්‍ය ආයෝජන වියදම් යටතේ වර්ගීකරණය කර ඇති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එසේ දැක්වීමට ක්‍රියාකර ඇත. මීට පෙර වර්ෂවලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී විමසුමේ සඳහන් වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමට අදාළ යන්ත්‍රසූත්‍ර හා වාහන අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද වියදම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේම දක්වා තිබුණි. | වියදම් නිවැරදි වැය විෂයයට ගිණුම් ගත කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස දෙක සඳහා පවිත්‍රතා සේවාව සඳහා රු. 305,900 ක වැට් බදු බැරකමක් හඳුනාගත යුතු වුවත් බැරකම් ලේඛනය අනුව එම අගය රු. 156,774ක් වූයෙන් රු. 149,126 ක අඩුවක් නිරීක්ෂණය විය. | අවසන් ගිණුම සකස් කරන අවස්ථාවේ නොවැම්බර් බිල්පත් පමණක් බැවින් බැරකම් ලෙස එම බිල්පත පමණක් ඇතුළත් කර ඇති බව කාරුණිකව දන්වමි. | වර්ෂයට අදාළ සියලු බැරකම් ගිණුම් ගත කළ යුතුය . |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| | (i)xxiv පරිච්ඡේදය 4.2.5ඡේදය | 159,800 | ආපසු ගෙවා අවසන් කර නැති ණය මුදලකින් අයකර ගැනීමට ඉතිරිව තිබෙන මුදල්ද, රජයට හෝ ලෝහෝර් ආර්යා අරමුදලට හෝ ගෙවීමට තිබෙන වෙනත් මුදල්ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විමසා නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල් වලින් හෝ අයකර ගත යුතු වුවත්, විශ්‍රාම ලබා ඇති නිලධාරියෙකුගේ වර්ෂ 1-2 ත් අතර හිඟ ණය ශේෂය වන රු.159,800 ක් 2023 අප්‍රේල් 06 දින වන විටද නිරවුල් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ සංචාරක අංශයේ රාජකාරී කර 2021.02.05 වන දින සිට විශ්‍රාම ලබා ඇති පරිපාලන නිලධාරී මහත්මියගෙන් අයවිය යුතු රු.159,800 ක මුදල නිරවුල් කරන ලෙස 2023.03.16 දිනැතිව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත. | ආයතන සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii)xxiv පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති | 253,578 | සේවය අතහැර ගොස් ඇති නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 253,578 ක ණය ශේෂයන් සම්බන්ධයෙන් ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී අනුගමනය කළයුතු යැයි නියම කොට ඇති ක්‍රියාමාර්ගය ඇපකරු සම්බන්ධයෙන් අනුගමනය කොට එම මුදල් ඇපකරුගෙන් අයකර ගතයුතු අතර, ප්‍රධාන ණයකරු මියගොස් ඇත්නම් ඔහුගේ උරුමක්කාරයන්ගෙන්ද අයකර ගත නොහැකි නම් නීතිපති උපදෙස් ලබා ගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සේවය හැරගොස් ඇති නිලධාරිනියගේ ලිපිනයන් වැරදිය.එසේම මෙම අමාත්‍යාංශයෙන් ණය ගෙන නොමැත. එබැවින් මෙම අමාත්‍යාංශයට ස්ථානමාරු වී පැමිණි පොලිස් මූලස්ථානය වෙතින් විස්තර විමසා අදාළ ණය ශේෂය ඇපකරුගෙන් අයකරගැනීමට කටයුතු කරනු ලැබේ.සේවය හැරගොස් ඇති කේ. මනුවෙල් මහතා සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාමගැන්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් තීරණය කර ඇත. හිඟ ණය ශේෂයන් ඔහුගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකරගැනීමට නොඉල්ලුම් සහතිකයට ඇතුළත් කර ඇත. | ආයතන සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මු.රෙ. 103(1) (ආ) | 353,600 | ආයතනයක හදිසි අනතුරු සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කළ යුතු වුවද, එකතුව රු.353,600 ක රිය අනතුරු 02 ක් පිළිබඳ එසේ සිදුකර නොතිබුණි. | මෙම අනතුරු ද්විත්වය සම්බන්ධව අමාත්‍යාංශය හෝ පොලිසිය දැනුවත් කර නොමැති අතර නැවත වාහන භාරදීමේ දී අලාභ හානි නිරීක්ෂණය විය. | හදිසි අනතුරු පොලිසියට වාර්තා කළ යුතුය. |
| (ii) මු.රෙ. 103(1) (ඊ) | 462,800 | හානිය සම්බන්ධයෙන් පරික්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කළ යුතු වුවත්, අංක KI – 1527 දරන රථය 2018 අගෝස්තු මස 20 දින මතුගම ප්‍රාදේශිය සභා රථගාලේදී සිදුවූ අනතුර සම්බන්ධයෙන් | KI–1527රථයේ 2018.08.20 දිනැති අනතුර සම්බන්ධව මු.රෙ.104(4) අවසන් පරීක්ෂණ වාර්තාව අනුව රථය අනුයුක්ත කර තිබුනු සම්බන්ධීකරණ ලේකම් වගකිව යුතු බව | අවසන් වාර්තාවේ සදහන් නිර්දේශ නොපමාව ක්‍රියාත්මක කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වූ අවසන් වාර්තාවට අනුව එම වාහනයේ ගමන් කළ ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් වගකිව යුතු බවට තිරණය කර එම අලාභයේ වටිනාකම රු.462,800 ක් ලෙස ගිණුම් වල දක්වා ඇතත් 2023 අප්‍රේල් 06 විගණිත දින වන විටද අලාභය අය කර ගෙන නොතිබුණි. | තීරණය කරන ලදුව, රථය අලුත් වැඩියා කිරීම සඳහා වැය වූ රු. 462,800/-ක මුදල ගෙවන ලෙස එම නිලධාරියාට දැනුම් දී ඇත. නමුත් මේ සම්බන්ධව මතුගම පොලිසිය විසින් මතුගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවත්වාගෙන යන බැවින් එම නඩුව අවසානයේ අයකිරීම් සම්බන්ධව සලකා බලන ලෙස එම නිලධාරියා විසින් ඉල්ලීමක් කර ඇත. දැනට මේ සම්බන්ධව මතුගම පොලිසිය වෙතින් වාර්තාවක් කැඳවා ඉදිරි කටයුතු කරමින් පවතී. | |
| (iii) මු.රෙ. 104(3) | 316,400 | අමාත්‍ය කාර්යාලයේ රු.316,400 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 30ක් 2022 මැයි 09 දින ගින්නකින් විනාශ වී තිබීම සහ ඉන්වෙන්ට්‍රි අයිතම 50 ක ඌනතාවයක් පැවතීම සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මේ යටතේ දක්වා ඇති ගින්නෙන් වූ හානි සම්බන්ධව මු.රෙ.104(4) අනුව අවසන් පරීක්ෂණ මණ්ඩල පත්කර ඇති අතර පරීක්ෂණ වාර්තාව අනුව ඉදිරි කටයුතු කරන බව දන්වමි. | නොපමාව පරීක්ෂණය නිමකර වගකිවයුතු පාර්ශවයන් ගෙන් අලාභය අය කර ගත යුතුය. |
| (iv) මු. රෙ. 109(1) | 2,031,327 | අයහාර, රක්ෂණ හා ඇප යනාදිය වැනි සියලු මාර්ගවලින් අය කරගත යුතු මුදල් ප්‍රමාණයන් නිර්ණය කිරීමද, ඇතුළුව සියලුම ප්‍රාරම්භක කටයුතු අවසන් කරනු ලැබීමෙන් පසු හානියෙන් අයකරගත යුතු උපරිම වටිනාකම හා අයකර ගැනීමට තීරණය කරන මුදලක් අතර යම් වෙනසක් ඇතොත් ඒ වෙනස පොතෙන් අස්කර දැමීමට, කටයුතු කළ යුතු වුවද එකතුව රු. 2,031,327 ක් වූ අවස්ථා 10 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | මේ යටතේ දක්වා ඇති අනතුරු සම්බන්ධ මු.රෙ.104(4) අනුව අවසන් පරීක්ෂණ පැවැත්වීම සඳහා පරීක්ෂණ මණ්ඩල පත් කර ඇති අතර පරීක්ෂණ වාර්තා ලබා ගෙන මු.රෙ.109(1) අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | සිදුව ඇති අලාභ නොපමාව පොත්වලින් කපාහැරිය යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | (v)මු.රෙ. 1647 (ඉ) | වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරයද, ලියාපදිංචි කිරීමේ අංකයද, තමන්ට බාරදුන් දිනයද,පැවරූ දිනය හා ඒ පිළිබඳව විස්තරද වෙනත් නිසි තොරතුරුද දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණි. | සංචාරක අංශයේ වාහන තොරතුරු ඇතුළත් යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් සකස් කර තිබුණු අතර එය මාර්ගගත ආකාරයට අදාළ තොරතුරු ලබාගත හැකිව තිබිණි. කෙසේ වුවද සංචාරක අංශය නව ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීම හේතුවෙන් අභ්‍යන්තර ජාලගත කරන කටයුතු මෙතෙක් අවසන් නොමැති බැවින් අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකිවිය. | මොටර් වාහන ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ | | | |
| | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශය විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021.12.29 දින වන විට අමාත්‍යාංශ පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය සකස් කර අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය තුළ ප්‍රදර්ශනය කර ඇත.මිහිකත මැදුර ගොඩනැගිල්ල තුළ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ඉඩම් අමාත්‍යාංශය පිහිටා ඇති බැවින්, පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කරන්නේ කොතැනද යන්න පැවති ගැටළුව මත හා අමාත්‍යාංශයෙහි කාර්යභාරය සංචාරක හා ඉඩම් ලෙස සංශෝධනය වූ බැවින් ඉහත ඉඩම් අමාත්‍යාංශයට අදාලව සකස් කළ පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කිරීමට කටයුතු නොකළ අතර මේ වන විට රාජ්‍ය | චක්‍රලේඛ උපදෙස් පරිදි පුරවැසි /සේවාලාභි ප්‍රඥප්තිය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වියදම් සීමා කිරීමේ චක්‍රලේඛ මත අනවශ්‍ය වියදම් සීමා කිරීමට සිදු වී ඇති බැවින් පුරවැසි ප්‍රඥප්තිය මුද්‍රණය කර නොමැත. | |
| (ඇ) | 2022 අප්‍රේල් 04 දිනැති අංක 05/2022 දරන වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 2 වගන්තිය. | අමාත්‍යාංශයේ සංචාරක අංශයේ ස්ථාවර වත්කම් ලේඛන ගත කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව Cigas වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලයක් සකසා ඇති බැවින් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම අනිවාර්යය නොවන බවට දන්වා ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය අනුව සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල වෙනුවෙන් නියමිත දායක මුදල් අදාළ මාසය ඉකුත් වී දින 14 ක් තුළ බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ සේවක අර්ථසාධක ලෙස රු.1,682,865 ක් සහ සේවක භාරකාර අරමුදල් රු. 154,304 ක් වශයෙන් එකතු දායක මුදල වූ රු.1,837,169 ක් එම ආයතන වෙත ප්‍රේෂණය නොකර අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. පනතේ 16 වන වගන්තිය අනුව එසේ නොගෙවන මුදල් සඳහා වගකිව යුතු නිලධාරීන් ගෙන් අධිභාර අයකළ යුතු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් උතුරු මැද පළාතේ ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර ව්‍යාපෘතියේ සේවකයන්ට 2021 වසරේ ජුනි මාසයේ සේවක අර්ථසාධක අරමුදල් සඳහා රු.1,290,950 ක්ද සේවක භාරකාර අරමුදලට රු.154,304 ක් ද වශයෙන් වෙන් කරන ලද මුදලක් වේ. මෙම ව්‍යාපෘතිය අවසන් වනතෙක් එම සේවකයන්ට අදාළ B ආකෘති පත්‍ර සකස් කර හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සේවා යෝජකයකු ලෙස ලියාපදිංචි වීමද සිදුව නොතිබුණු අතර , මේ වන විට එම ආකෘති පත්‍ර සම්පූර්ණ කර කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් කටයුතු සූදානම් කර ඇත.එම කටයුතු අවසන් වූ අරමුදල් ගෙවීම් කිරීමට කටයුතු සිදුකරනු ලබන බව දන්වා සිටිමි. | නොපමාව හිඟ අරමුදල් සේවක අර්ථසාදක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට යැවිය යුතු ය. |
| (ආ) | මු.රෙ. 571(3) පරිදි ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් ඉකුත්වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැරකළ යුතු හෝ නැතහොත් ඉක්මනින් ආපසු | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් කාබනික පොහොර ව්‍යාපෘතියට අදාළ ගෙවීම් කටයුතු සඳහා නිකුත් කරන ලද රු.33,869,485ක් වටිනා චෙක්පත් 61ක් අවලංගු කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඒවා පොදු තැන්පතු ගිණුමට බැරකර ඉල්ලීම් ලැබෙන පරිදි. ආපසු ගෙවීමට අදාළ කටයුතු | නොපමාව තැන්පතු නිරවුල් කළ යුතු ය. |

| | |
|---|---|
| ගෙවිය යුතු වුවත් කාබනික පොහොර ව්‍යාපෘතියට අදාළව ගෙවීම් කිරීම සඳහා රඳවා ගෙන තිබුණු රු.33,869,485 ක මුදලක් 2022 අප්‍රේල් 24 දින සිට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති දැනුවත් කරමින් අංක 03/12/8 මගින් 2023.02.28 දිනැතිව හා අංක 3/1/2 මගින් 2023.04.04 දිනැතිව ලිපි යොමුකර ඇත. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව මාස 06 ඉක්මවූ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් හඳුනාගෙන ගෙන ආදායමට ගැනීමට කටයුතු කළයුතු වුවද, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ බැංකු ගිණුමෙහි රු.24,666 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | රු.24,666 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ 396 ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | චෙක්පත අවලංගු කර ගෙවන්නට ඇති මුදල ණයක් වශයෙන් ගිණුම් ගත කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනත සහ 2002 අංක 17 දරන මැනුම් පනත සම්බන්ධව සංශෝධිත පනත් කෙටුම්පත් ගැසට් පත්‍රයේ පළ කිරීම සහ එම සංශෝධිත පනත් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම සිදුකර නොතිබුණි. | 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනත සංශෝධනයට කැබිනට් අනුමැතිය ලබාගෙන ඇති අතර නීති කෙටුම්පත් සම්පාදක පනත කෙටුම්පත් කරමින් පවතී.2002 අංක 17 දරන මැනුම් පනතසංශෝධනය සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් සහ මැනුම් සභාවෙන් ලැබී ඇති යෝජනා සාකච්ඡා කෙරෙමින් පවතී. | කඩිනමින් අදාළ පනත සම්මත කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2022 කාර්යසාධන වාර්තාවේ දැක්වෙන පරිදි 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ උපදෙස් ලබාගෙන අවශ්‍ය සංශෝධන ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණු අතර 1979 අංක 43 දරන රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ සංශෝධනය | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සඳහා සංශෝධනයන් හඳුන්වාදෙනු ලබන්නේද නැතහොත් නව පනතක් ඒ සඳහා හඳුන්වා දීම සුදුසුද යන්න තීරණය කළ යුතු බවට අධිකරණ අමාත්‍යාංශය විසින් 2023.02.24 දින පවත්වන ලද වැඩමුළුවේදී සාකච්ඡාවට බඳුන්විය. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදීද සාකච්ඡා කිරීමට තීරණය විය. 1979 අංක 43 දරන රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධන හඳුනාගැනීමට මුලික සාකච්ඡා පවත්වා ඇත. | කඩිනමින් අදාළ පනත් සම්මත කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කළ යුතු වගන්ති හඳුනාගෙන ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් අත්පත් කරගැනීමට කුරුණෑගල, පුත්තලම, රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්ක 04 සඳහා වෙන්කළ රු.234,722,810 ක ප්‍රතිපාදනයෙන් රු.74,703,644 ක් උපයෝජනය කර රු.160,019,166 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය ප්‍රතිශතයක් ලෙස සියයට 50 ත් 79 අතර අගයක් විය. | වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කළ ද, අක් මුදල් නිදහස් නොකිරීම මත රු.160,019,166ක් ඉතිරි වී ඇත. අක් මුදල් නිදහස් කිරීම භාණ්ඩාගාරය මඟින් සිදු වන්නකි. 2022 දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කළද අක් මුදල් ලබා නොදීම මත වර්ෂයේ වැඩි මුදල් ප්‍රමාණයක් ඉතිරි ඇති බව නිරීක්ෂණය වේ. | සැලසුම් කළ කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කිරීම. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාව තුළ කෘෂි, වාණිජ, සංචාරක හා වෙනත් සේවා නිෂ්පාදන අංශ නියෝජනය කරමින් විවිධ නිෂ්පාදනයන් හි නියලී සිටින එමෙන්ම ව්‍යවසායකත්ව හැකියාව ඇතත් ඒ සඳහා මූලික පරීක්ෂණ රාජ්‍ය සහාය තවමත් ලැබී නොමැති තරුණයින් තෝරා ගෙන ඔවුන්ට ඉඩම් හිමිකම ලබා දීම මඟින් දේශිය නිෂ්පාදන දිරිගැන්වීම හා ඊට අවශ්‍ය ආයතනික සහාය ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක කළ තරුණ ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා රජයේ ඉඩම් වල ආයෝජන අවස්ථා ලබා දීමේ වැඩසටහන මඟින් සමාලෝචිත වර්ෂයේදී ඉඩම් කැබලි 20,000 ක් ලබා දීමට සැලසුම් කර භෞතිකව ඉඩම් ලබාදීමේදී කළුතරට 03 ක්ද, ගාල්ලට 04 ක්ද, කුරුණෑගලට 28 ක්ද, රත්නපුර සහ බදුල්ල දිස්ත්‍රික්ක වලට 6 බැගින්ද, ලෙස ඉඩම් කැබලි 47 ක් ලබා දී තිබුණි. එය සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 5 ක පමණ අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකාවේ තරුණ ව්‍යවසායකත්වය දිරිගැන්විමේ අරමුණින් රජයේ ඉඩම්වල ආයෝජන අවස්ථා ලබාදිමට ආරම්භ කළ මෙම වැඩසටහනට 2022 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන ඉල්ලුම් කළ ද, මෙම ව්‍යාපෘතිය සඳහා අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කර නොතිබීම නිසා වර්ෂය අවසාන වන විට මෙම වැඩසටහන යටතේ ලබාදීමට හැකි වූ මුළු ඉඩම් කැබලි ගණන 1,119 කට පමණක් සීමා විය. | සැලසුම් කළ පරිදි ඉලක්ක කරා ළඟා විමට කටයුතු කළ යුතුය . |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **කාබනික පොහොර ව්‍යාපෘතිය** | | |
| (i) | පසුගිය වර්ෂයේ දී රු.350,000,000 ක ප්‍රතිපාදනය වැය කර අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක කාබනික පොහොර ව්‍යාපෘති ආරම්භ කර ඒ සඳහා රු.31,027,575 ක් වටිනා වගා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය වසා දමා ඇතත්, ව්‍යාපෘතියේ වත්කම් වල ආරක්ෂාව සම්බන්ධයෙන් හෝ වත්කම් නැවත ඵලදායි කාර්යයකට යෙදවීම සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 10 වන විට ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2022.04.22 දිනට වත්කම් ලේඛනය, කාබනික පොහොර නිෂ්පාදන නියමු ව්‍යාපෘතියේ මධ්‍යස්ථාන 33 ගොවි සංවිධාන වෙත පැවරීමට අදාළව සකස් කරන ලද වත්කම් ලේඛනය වේ. එනම්, අංක 9/2/6/1-vol iii හා 2022.04.22 දිනෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලද ලිපියට අදාළ ඇමුණුම වේ. මෙම ලේඛනයේ ඔයාමඩුව ගබඩාව, සේනානායක ගබඩාව සහ කාර්යල ගබඩාවේ ඇති උපකරණ,ද්‍රව්‍ය ඇතුළත් කර නොමැති බවත් එසේ ඇතුළත් නොකිරීමට හේතු වූයේ එම ගබඩා එම අවස්ථාවේ ගොවි සංවිධාන වෙත පැවරීමට අදහස් නොකළ බැවින් බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් වල ආරක්ෂාව සහ ඒවා ඵලදායිව යෙදවීම සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ii) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව උතුරු මැද පළාතේ ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර ව්‍යාපෘතිය අවසන් කොට සම්පත් බැහැර කිරීම සම්බන්ධයෙන් 2023 මාර්තු 28 දිනැති අමප/23/0383/615/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට හේතු වී ඇති කරුණු, මුදල් භාවිතා වී ඇති ආකාරය සහ ඒ සඳහා දායක වූ පාර්ශවයන් පිළිබඳ ස්වාධීන පූර්ණ විමර්ශනයක් සිදු කිරීමටත්. අදාළ ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සුදුසු යෝජනා සහිත වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමටත් අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023.03.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය ලේකම් මහින් 2023.04.17 දින ලැබී එකී සංදේශයට අනුව, ඉදිරි පියවර ඉතා කඩිනමින් ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගැඹුරින් අධ්‍යනය කොට ව්‍යාපෘතිය අත්හිටුවීමට බලපෑ හේතු හා මුදල් භාවිතය හා දායක වූ පිරිස් පිළිබඳව අවධානය යොමු කරමින් ස්වාධීන පරීක්ෂණයක් සිදු කිරීම සඳහා විමර්ශන කමිටුවක් 2023.04.29 දිනැති සාකච්ඡාවේදී හා මාගේ අත්සනින් පත් කරන ලදී. එකී කමිටුව සඳහා,හිටපු රාජ්‍ය අමාත්‍ය ලේකම්වරයෙකු හා අමාත්‍යාංශ අතිරේක ලේකම්වරයෙකු,ප්‍රධාන මූල්‍ය නිලධාරියෙකු හා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ විධායක මට්ටමේ නිලධාරියෙක් ද වශයෙන් සමන්විත වේ. අදාල විමර්ශන කටයුතු මේ වන විට ආරම්භ කර සිදුකරගෙන යමින් තිබේ. | ස්වාධීන පූර්ණ පරීක්ෂණයක් සිදු කර ඒ අනුව විනය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | ව්‍යාපෘතිය පිළිබඳව ගැඹුරින් අධ්‍යනයක් කළ යුතුව ඇති බවත්, ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව විමර්ශනයක් සිදු කළ යුතු බවත් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ගත වන බවත් කමිටුවේ සභාපතිවරයා දන්වා ඇති අතර, විමර්ශන වාර්තාව ලබාදීම සඳහා අවම වශයෙන් සති 06ක පමණ කාලයක් අවශ්‍ය බව දන්වා ඇත. එම වාර්තාව ලද පසු මේ සම්බන්ධයෙන් ඉදිරිකටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | |
| (iii) කාබනික පොහොර ව්‍යාපෘතිය වෙනුවෙන් ලංකා බැංකුව අනුරාධපුර හා බත්තරමුල්ල ශාඛාවන් වල බැංකු ගිණුම් 02 හි ගනුදෙනු සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබූ අතර ඒවා විගණිත දිනට අක්‍රීය ගිණුම් බවට පත්වී ඇතත් ඒ සම්බන්ධ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවීය. | කළමණාකරනය විසින් අදහස් දක්වා නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) අමාත්‍යාංශයට අයත් අංක WP UL 1769 දරන යතුරුපැදිය වර්ෂ ගණනාවක සිට ධාවන තත්ත්වයේ නොපවතින අතර අලුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායිද යන්න පිළිබඳ කිසිදු පරීක්ෂාවකින් තොරව පැවතුණි. | කළමණාකරනය විසින් අදහස් දක්වා නොතිබුණි . | අලුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායිද යන්න සොයා බැලිය යුතුය. |

**3.4 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක PE – 0628 දරන වාහනයේ 2022 අගෝස්තු මස 04 දින සිදුවූ අනතුර සම්බන්ධ හානියේ වටිනාකම රු.323,600 ක් ලෙස තක්සේරු කර ඇති අතර මේ සඳහා එහි රියදුරු වගකිව යුතු බවට පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව අනාවරණය වී තිබුණද, ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | PF- 0628 රථය හිටපු අමාත්‍යවරයාට අනුයුක්ත රථයකි. මෙම අනතුර සම්බන්ධව අමාත්‍යාංශය දැනුවත් කර නොමැති අතර පොලිසියටද වාර්තා කර නොමැත. මු.රෙ. 104 (3) මූලික පරීක්ෂණ වාර්තාව පරිදි රියදුරු වගකිව යුතු බව නිරීක්ෂණය කර ඇත. අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව ද ඉදිරිපත් කර මේ වන විට මු.රෙ. 104 (4) අවසන් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත. අවසන් පරීක්ෂණ වාර්තාව ලද පසු සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරමි. | රියදුරුගෙන් අයකරගත යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමට අවශ්‍ය රු.2,513,476,724 ක ප්‍රතිපාදන2021 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කළ ද, අදාළ ප්‍රතිපාදන වන්දිලාභීන්ට ගෙවූ බවට වන තහවුරුවක් ලබා ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන වෙන් කළද භාණ්ඩාගාරය අක්මුදල් නිදහස් කිරීම සිදු කරනු ලබන බැවින් සෑම වර්ෂයකම අවසානයේ අක්මුදල් ලැබීම හා වන්දි ලාභීන් වෙත මුදල් නිදහස් කිරීම සම්බන්ධව එක් එක් ප්‍රාදේශීය ලේකම් වෙතින් වාර්තා කැඳවීම සිදු කරනු ලබයි. එමෙන්ම ඉදිරියේදී ප්‍රාදේශී0ය ලේකම් කාර්යාල හා සම්බන්ධවීම සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගි කර ගනිමින් දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. | සත්‍ය ලෙස වන්දි ගෙවූ වටිනාකම පිළිබඳ තහවුරුවක් ලබා ගෙන ඉතිරිවීම් හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගන්දර හා තලල්ල ගම්වල පිහිටි අක්කර 10 රූඩ් 02 පර්චස් 27.26 ක ඉඩම් ගන්දර ධීවර වරාය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය ප්‍රකාරව දැන්වීම් පළ කිරීම 2021 අප්‍රේල් 21 දින සිදු කර පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධාන ආඥාව 2022 පෙබරවාරි 10 දිනැති අංක 2266/51 දරන ගැසට් පත්‍රයේ පළ කර ඒ සඳහා වන්දි ගෙවීමට රු.31,500,000 ක මුදලක් ධීවර අමාත්‍යාංශය විසින් දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත 2021 ජනවාරි 06 දින ගෙවා තිබුණද වන්දි හිමිකරුවන්ට ගෙවීමට කටයුතු නොකර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ජංගම ගිණුමක රඳවා තිබුණි. මේ හේතුවෙන් වන්දි සඳහා ගෙවිය යුතු පොලී මුදල් වැඩි වීමට අවකාශ ඇති බව විගණනයේදි නිරීක්ෂණය විය. | යම් ආයතනයකට, දෙපාර්තමේන්තු වකට හෝ අමාත්‍යාංශයක් සඳහා ඉඩමක් අවශ්‍ය වන විට ඒ සඳහා වන තක්සේරුගත මුදල අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ තැන්පත් කිරීම හෝ මු.රෙ 53 අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් එකී අත්කර ගැනීම ආරම්භ කරනු ලබයි. අත්කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර හිමිකම් පරීක්ෂණ පවත්වා හිමිකම තීරණය කිරීමෙන් අනතුරුව වන්දි ගෙවීම සිදු කරනු ලබයි. දැනට මෙම අත්කර ගැනීම පනතේ 7 වගන්තිය දක්වා කටයුතු කර ඇත. | පොලී නොගෙවන ආකාරයට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර කඩිනමින් වන්දි ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අංක 253 – 3555 දරන වාහනයේ අභ්‍යන්තර අලුත්වැඩියාව සඳහා 2020 සැප්තැම්බර් 30 දින මිල ගණන් කැඳවා අවම මිල ඉදිරිපත් කළ තලවතුගොඩ ප්‍රදේශයේ පෞද්ගලික අනුමත ගරාජයක් වෙත රු.389,000 ක ඇස්තමේන්තුවකට අලුත්වැඩියාව සඳහා භාර දී වර්ෂ දෙකකට වැඩි කාලයක් එම ගරාජය තුළම රඳවාගෙන සිට නැවත වතාවක් මිල ගණන් කැඳවා රු.1,020,000 කට අලුත්වැඩියාව නිමකර 2023 මාර්තු 28 දින අමාත්‍යාංශය වෙත භාරදී තිබුණි. වාහනයේ එන්ජින් අංකය (4D56JSO 455) සහ ලියාපදිංචි සහතිකයේ එන්ජින් අංකය (JWYJNK 340 WP 0129) පරස්පරව පැවතීම නිසා මෙම වාහනය අලුත්වැඩියා කිරීමට ප්‍රමාද වූ බව වැඩිදුරටත් නිරීක්ෂණය වූ අතර එම ගැටලුව විසඳීම සඳහා අමාත්‍යාංශය විසින් කඩිනම් පියවර නොගැනීම හේතුවෙන් අලුත්වැඩියාව සඳහා අමාත්‍යාංශයට රු.631,000 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | අංක 253-3555 අංක දරන රථයේ එන්ජිම සම්බන්ධ අලුත්වැඩියාවක් ඇති වූ බැවින්, රා.ප.ච. 03/2016 යටතේ ඉන්දික මෝටර්ස් ආයතනය වෙත යොමු කර කොටස් ගලවා බලා 2020.09.30 දිනැතිව රු.389,000 ක මිල ඇස්තමේන්තුව සඳහා නිර්දේශ ලබා ගැනීමට රථය යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු කළ විට, එහි ලියාපදිංචි එන්ජින් අංකය හා නොගැලපෙන බව අනාවරණයව ඇත.මේ සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් විමසන ලදි. නමුත්, රටේ පැවති COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන්, රාජකාරී සඳහා බාධා ඇති වූ බැවින්, එම දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලැබීමට ප්‍රමාද වී ඇත. එහිදී රථය මෝටර් රථ පරීක්ෂකයෙකුට පෙන්වා වාර්තාවක් ලබා ගන්නා මෙන් උපදෙස් ලද අතර ඒ සඳහා සුදුසු මෝටර් රථ පරීක්ෂකයෙකුගේ සහය ලබා ගැනීමට කිහිපවරක් ලිඛිතව හා වාචිකව ඉල්ලීම් කළද පැවති තත්ත්වය හමුවේ එම සහය නොලැබුණි. පසුව මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලද යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ගොස් ගැටළුව ඉදිරිපත් කිරීමෙන් පසුව රථය අලුත්වැඩියා කර වේරහැර ශාඛාව වෙත ගොස් පරීක්ෂා කළ යුතු බවට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, රථය ධාවන තත්වයේ නොතිබූ බැවින්, යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය මත රා.ප.ච. 03/2016 යටතේ ඉන්දික මෝටර්ස් ආයතනය වෙතින් නව මිල ඇස්තමේන්තුවක් ලබා ගැනීමට කටයුතු කරන ලදි. එහිදී, 2023.01.09 දිනැතිව, රු.1,020,000 ක මිල ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත.පවතින ආර්ථික අර්බුදය හමුවේ වර්තමාන වෙළඳපොළ තුළ රථ වාහන අමතර කොටස් වල අසාමාන්‍ය මිල වැඩිවීමක් සිදුව ඇති බැවින්, නව මිල ඇස්තමේන්තුව යටතේ අලුත්වැඩියාව සිදු කිරීමට සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබුණි. අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් සියලු යාන්ත්‍රික නිර්දේශයන් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්ත යාන්ත්‍රික | එන්ජින් අංකය වෙනස් වුනේ කෙසේද යන්න පරීක්ෂා කර ඒ අනුව ඉදිරි පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉංජිනේරු වෙතින් සහ තාක්ෂණ නිලධාරියෙක් වෙතින් ලබා ගැනීමට සිදු විය. මෙහිදී, ප්‍රායෝගිකව බොහෝ ප්‍රමාදවීම් සිදු වූ අතර මේ වන විට රථය අලුත්වැඩියාව නිමා කර ඇති අතර ලියාපදිංචි සහතිකය නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවද දන්වා සිටිමි. | |
| (ඈ) | මොරගහහේන උප නගර සංවර්ධනය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මොරගහහේන ගමේ පිඹුරු අංක 4406 හි අක්කර 01 රූඩ් 02 පර්චස් 20 ඉඩම (හෙක්ටයාර් 0.6545) අත්පත් කර ගැනීම සඳහා වූ ඉල්ලුම්පත 2007 සැප්තැම්බර් 06 දින නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී 2008 ජූලි 31 දිනැති ගැසට්පත් අංක 1560/16 මඟින් 38(අ) අතුරු විධානය පළ කර ඉඩමේ භුක්තිය භාරගෙන තිබුණි. ඉඩමේ භුක්තිය රජයට භාර ගෙන වසර 05 කට පසුව ඉඩම් සඳහා අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබුණු අතර වන්දි මුදල් හිමි තැනැත්තන්ගේ නම්, ලිපිනයන්, ඉඩමේ විස්තර හා වන්දි මුදල පිළිබඳ දැක්වෙන විස්තර 17 වගන්තිය යටතේ පළ කිරීමට 7 වගන්තිය පළ කල දින සිට වසර 06 ක කාලයක් ගත වී තිබුණි. මේ අනුව ඉහත ක්‍රියාවලිය සඳහා වසර 12 ක පමණ කාලයක් ඉක්මවා තිබීම හේතුවෙන් කැබලි අංක 1,10,11,14 සඳහා ගෙවන ලද වන්දි මුදල වූ රු.26,180,250 ක් සඳහා පොලී මුදල් ලෙස රු.24,227,134 ක් අනාර්ථිකව ගෙවීමට සිදු වී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. | මෙම අත්කර ගැනීමට අදාළව සකස් කරන ලද මූලික පිඹුරේ කැබලි 26ක් ඇති අතර එම එක් එක් කැබැල්ල වෙන වෙනම හිමිකම් පරික්ෂණ පැවැත්විය යුතු අතර, එම එක් එක් කැබලි සඳහා ඉදිරිපත් වන ගැටළු විවිධාකාර වේ. එබැවින් ඉදිරිපත් වන ගැටලු පිළිබඳ ඉඩම් අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව හා වන්දි සමාලෝචන මණ්ඩලය වැනි ආයතන මඟින් නිරවුල් කර ගනිමින් කටයුතු කල යුතු වේ. එබැවින් හිමිකම් පරීක්ෂණ සඳහා ගතවන කාලය පාලනය කිරීමට හැකියාවක් නොමැති අතර, අත්කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා හා පවතින දූර්වලතා අවම කිරීම සඳහා අත්කර ගැනීමේ පනත සංශෝධනයට අදාළ මූලික කෙටුම්පත් සකස් කර ඇත. තවද, අත්කර ගැනීමේ ගොණු වල පසුවිපරම් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් දත්ත පද්ධති සකස් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එය ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින්ද ව්‍යාප්ත කිරීමට කටයුතු කරමින් පවතී. | අනාර්ථික පොළී නොගෙවන ආකාරයට වන්දි ගෙවීම් කළ යුතුය. |
| (ඉ) | ත්‍රිවිධ හමුදා මූලස්ථානය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ තලංගම දකුණ ගමෙහි පිහිටි හෙක්ටයාර් 0.492 ක් පමණ වූ ඉඩම් කොටස් 274 ක් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2013 ජුනි 26 දින අත්පත් කර ගැනීමේ ඉල්ලීම, අමාත්‍යාංශයට යොමු කර තිබුණි. එහෙත් ඉඩම් අත්පත් කර ගැනීම පනතේ 460 | පොදු කාර්යයක් සඳහා භාවිතා කරන ආයතනය විසින් එම ඉඩමේ පවතින යෝග්‍යතාවය ඇතුළු අනෙකුත් සාධක පරික්ෂා කර බැලීමෙන් අනතුරුව ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව පිළියෙල කර ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ. 38 (අ) අතුරු විධානය නිකුත් කිරීම සඳහා එවකට ගරු රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යතුමා විසින් 2014.09.19 දිනැතිව නිර්දේශය යොමු කර ඇත. 38(අ) අතුරු විධානය නිකුත් | අනාර්ථික පොළී නොගෙවන ආකාරයට වන්දි ගෙවීම් කල යුතුය. |

වෙනි පරිච්ඡේදයේ 248 නියෝගය (අ) ප්‍රකාරව මූලික විමර්ශනයක් පවත්වා ඉඩමේ යෝග්‍යතාවය, ඵලදායීතාවය, ඉඩම අත් කිරීමෙන් ඉඩමේ හිමිකරුට සිදුවන පීඩාකාරීත්වය, සහ ප්‍රදේශයේ පවතින සෙසු සංවර්ධන සැලසුම ආදිය පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.එසේම පනතේ 38 වැනි වගන්තිය යටතේ හදිසි අත්‍යාවශ්‍ය කරුණක් සඳහා ඉඩමේ අයිතිය භාර ගැනීම අවශ්‍ය වන බව ඉල්ලුම්කාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ දැනුම්දීම මත සිදුවන්නක් වුවද, එසේ නොමැතිව අතුරු විධානයක් ගැසට් පත්‍රයෙහි පල කර අයදුම්පත් යොමු කළ දිනයේ සිට රජයට ඉඩම් පවරා ගැනීම සිදු කිරීම. එනම් 38 (අ) අතුරු ආඥාව පල කර දින සිට වර්ෂ 01 ක් සහ මාස 06 ක කාලයකට පසුව එනම් 2015 ජූලි 16 දිනඅදාළ ඉඩම කොළඹ දිස්ත්‍රික් ලේකම් භාරගෙන රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට ඉඩම භාර දීම කවදා සිදු වූයේද යන්න පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි.එසේම මු.රෙ. 53 (4) හා (5) ප්‍රකාර අත්පත් කර ගන්නා ඉඩම් වලට අදාළව අනුමත කරන ලද යෝජනා වල උප ලේඛනයක් සෑම වර්ෂයකම පෙබරවාරි 15 ට පෙර අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.පනතේ 38 (අ) අතුරු විධානය යටතේ වන ගැසට් පත්‍රය නිකුත් කළ දිනයේ සිට වන්දි ගෙවන දිනය දක්වා වන කාලසීමාවට පොලී මුදලක්ද වන්දි හිමියන් වෙත ගෙවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම අත්පත් කරගත් ඉඩම් සඳහා අමාත්‍යාංශය විසින් පොලී ගෙවීම සඳහා ප්‍රතිපාදන නිදහස් කර නොතිබුණ අතර ඒ අනුව සියයට 7 බැගින් පොලී ගෙවිය යුතු වර්ෂ ගණන වසර 3 ත් 4 ත් අතර කාලයක් වන බව නිරීක්ෂණය විය.

කළ පසු අදාළ ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව භුක්තිය භාර ගැනීමේ ක්‍රියාවලිය සිදු කළ යුතු අතර 38 (අ) අතරු විධානය කැබලි 272ක් සඳහා නිකුත් කර ඇති බැවින් මේ සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ. මෙම අත්කර ගැනීමට අදාළව ඉඩමේ හිමිකරු වෙතින් භුක්තිය භාර ගන්නා අවස්ථාවේදීම එම ඉඩම් කැබැල්ලේ භුක්තිය අදාළ ආයතනය වෙත ලබා දී ඇති බැවින් භුක්තිය භාර දීම එක් දිනයක් ලෙස සඳහන් කළ නොහැක. ජාතික ආරක්ෂාව සම්බන්ධ කටයුත්තක් වන මෙම අත්කරගැනීමට අදාළ පරිපාලන වියදම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගෙවීම හේතුවෙන්, වන්දි ගෙවීමට පෙර මු.රෙ. 53 අනුමැතිය ලබාදෙන පදනම යටතේ අත්කරගැනීමේ ක්‍රියාත්මක කර තිබේ. වන්දි ගෙවීමට පෙර මු.රෙ. 53 අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කර ඇත.

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ. | | |

| | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| | ----- | ---- | ----- |
| ජොෂ්ඨ | 35 | 27 | 08 |
| තෘතියික | 05 | 03 | 02 |
| ද්විතියික | 546 | 533 | 13 |
| ප්‍රාථමික | 51 | 30 | 21 |
| වෙනත් | 03 | 01 | 02 |
| | 640 | 594 | 46 |

එයට අදාළව පහත නිරීක්ෂණයන් ඉදිරිපත් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 640 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 594 ක් වූයෙන් පුරප්පාඩු 46 ක් පැවතුණි.<br><br>(ආ) අනුමත ජොෂ්ඨ මට්ටමේ තනතුරු 08 දෙනෙක්ද, තෘතියික මට්ටමේ 02 දෙනෙක්ද, ද්විතීක මට්ටමේ 13 දෙනෙක්ද, ප්‍රාථමික මට්ටමේ 21 දෙනෙක්ද, වෙනත් තනතුරු 02 කට අදාළ සේවකයන් ඇතුළු 46 කගේ පුරප්පාඩු වී පැවතිණි. | 2022.12.31 දිනට ජොෂ්ඨ, ද්විතීයක, තෘතීක මට්ටමට අදාළ තනතුරු පුරප්පාඩු පිළිබඳ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.දෙපාර්තමේන්තු ගත තනතුරක් වන ලඝු ලේඛක (සිංහල) තනතුරු සඳහා බඳවා ගැනීමට සියලු කටයුතු අවසන් කර තිබුනද ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 උපදෙස් මත ස්ථිර පත්වීම් ප්‍රදානය නවතා ඇත. තනතුරු වල අත්‍යාවශ්‍යභාවය මත (ලඝු ලේඛක -සිංහල, නිති නිලධාරී තනතුරු) පදනම්ව බඳවා ගැනීමට අවසර ලබා ගැනීමට රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ අමාත්‍ය මණ්ඩල නිලධාරී කමිටුව වෙත යොමු කර ඇත. | පුරප්පාඩු පිරවිය යුතුය. |